සකස් කළේ - කේ.එම්.ධනුෂිකා දිල්ශානි කුරුප්පු
ර/ඇහැළියගොඩ ම.ම.වි.

නිපුණතාවය 12.0- පුද්ගලයන්ගේ හා සංවිධානවල පරමාර්ථ හා අරමුණු ඉටුකරගැනීම සඳහා කළමනාකරණයේ අවශ්‍යතාව හා වැදගත්කම පෙන්වා දෙයි.

නිපුණතා මට්ටම 12.2 - කළමනාකරුවෙකුගේ විවිධ භූමිකා විමසයි.

**<u>කළමනාකරු (Manager)-සං</u>**විධානයක පරමාර්ථ හා අරමුණු ළඟා කර ගැනීම සඳහා සැලසුම්කරණය , සංවිධානකරණය, මෙහෙයවීම හා පාලනය කරනු ලබන්නා කළමනාකරු වේ. තවද මොහු විසින් කළමනාකරණ ක්‍රියාවලිය ඔස්සේ සම්පත් කාර්යක්ෂමව සහ සඵලදායිව උපයෝජනය කරනු ලබයි.

## <u>කළමනාකරුවන්ගේ උපභූමිකා (Sub Roles)</u>

කළමනාකරු සතු මෙම උපභූමිකා 10 හඳුන්වා දී ඇත්තේ හෙන්රි මින්ට්ස්බර්ග්(Henry Minttzberg) විසිනි.ඒවා ප්‍රධාන වශයෙන් ශීර්ෂ 3ක් යටතේ දැක්විය හැක.

- ❑ අන්තර්පුද්ගල භූමිකා( Interpersonal Roles)
- ❑ තොරතුරු භූමිකා (Informational Roles)
- ❑ තීරණ භූමිකා (Decisional Roles)

<u>අභ්‍යාස</u>

1.පහත දක්වා ඇත්තේ කළමනාකරුවෙකු විසින් ඉටුකරනු ලබන කාර්යයන් කිහිපයක් සඳහා නිදසුන්ය. එම එක් එක් කාර්යයයන් ඉදිරියෙන් ඔබ විසින් හඳුනාගත් කළමනාකරණ උප භූමිකාව කුමක්දැයි ඉදිරියෙන් දක්වන්න.

1. සේවක දුක් ගැනවිලි සඳහා සවන් දීම.
2. කොටස් හිමියන් සමඟ රැස්වීම් පැවැත්වීම.
3. ආයතනය තුළ නව සෞඛ්‍ය ආරක්ෂණ වැඩසටහනක් හඳුන්වාදීම.
4. ආයතනය තුළ සිටින දක්ෂ සේවකයන් ඇගයීම.
5. තම සේවකයන් සෑම සතියකටම වරක් PCR පරීක්ෂණ සඳහා යොමු කිරීම.
6. කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය විසින් සංවිධානය කරන ලද රැස්වීමක් සඳහා සහභාගී වීම.
7. සැපයුම්කරුවන් සමග සිව් අවුරුදු ගිවිසුමකට අත්සන් කිරීම.

2.හෙන්රි මින්ට්ස්බර්ග් විසින් විස්තර කළ , කළමනාකරුවෙකුගේ තීරණ ගැනීමේ භූමිකාවට අයත් උපභූමිකා හතර නම් කරන්න.

3. කළමනාකරුවෙකුගේ එක් තොරතුරු භූමිකාවක් තෝරාගෙන එම භූමිකාව තුළ ඉටු කළ යුතු කාර්ය දෙකක් උදාහරණ දක්වමින් විස්තර කරන්න.

4. කළමනාකරුවෙකුගේ පහත සඳහන් භූමිකාවලට උදාහරණය බැගින් සපයන්න.

1. නායකයා
2. තොරතුරු බෙදාහරින්නා
3. නියාමකයා
4. බාධා පාලනය කරන්නා
5. සාකච්ඡා කරන්නා